කොවිඩ්-19 වසංගතය මර්දනය කිරීමට ලෝකයම උත්සුක වෙමින් සිටිනා මෙම අවස්ථාවේදී, සමාජය තුළ කොවිඩ්-19 ආසාදිතයින් පිළිබඳව ගර්හාවක් සහ කොන් කිරීමේ ආකල්පයක් ඇති වීම වැළැක්වීමද මාධ්‍ය අත රැඳි වගකීම් වලින් එකක් වේ. විශේෂයෙන්ම සමාජය තුළ කොවිඩ්-19 හා සම්බන්ධ වන අය කෙරෙහි ගර්හාවක් සහ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීම ඔස්සේ, රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට නැඹුරුවීම ඊට හේතුවයි. එවිට සිදුවන්නේ වෛරසය පැතිරීම මර්දනය දුෂ්කර වීම වැනි ගැටළු පැන නැගීමයි. එනිසා, කොවිඩ්-19 සම්බන්ධයෙන් එවන් ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පයන් ඇති කරවිය හැකි ශිෂ්ට සම්පන්න නොවන හැඳින්වීම් සහ යෙදුම් භාවිතයෙන් වැළකීම යහපත් යැයි අපි පවසමු.

පහත දත්ත සටහන ඔස්සේ ඉදිරිපත් කොට ඇත්තේ, 2020 ඔක්තෝබර් 10 සිට ඔක්තෝබර් 23 දක්වා කාලය තුළ තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ පළවූ පුවත් වාර්තාවන්හි මෙම කොවිඩ්-19 හා සම්බන්ධ ශිෂ්ට සම්පන්න නොවන, නිෂේධනාත්මක යෙදුම් දක්නට ලැබුණු වාර ගණනයි. මෙහිදී "කොරෝනා කත", "කොරෝනා සුද්දා", "කොරෝනා මනමාලි" වැනි, පුද්ගලයින්ව කොන් කිරීමකට බඳුන් කළ හැකි යෙදුම් සම්බන්ධයෙන් සලකා බලා ඇත.
සිරස්තලයක් යෙදීමේදී අවම වචන ප්‍රමාණයකින් අදහසක් හෝ පණිවුඩයක් දැක්වීමේ අවශ්‍යතාවය කෙසේ වුවත්, මෙවැනි ශිෂ්ට සම්පන්න නොවන භාෂා භාවිතයකට එය නිදහසට කරුණක් නොවන බව නැවත සිහිපත් කිරීමට මෙය අවස්ථාව කර ගනිමු.

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Divaina #SundayDivaina #Mawbima #SundayMawbima #Lankadeepa #SundayLankadeepa #Dinamina #Silumina #Aruna #SathiAgaAruna**